# සබරගමුව විශ්ව විද්‍යාලය -2010

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) විශ්ව විද්‍යාලය සතුව පැවති රහංගල පිහිටි කෘෂිවිද්‍යා පීඨයට අයත් ඉඩම් හා ගොඩනැගිලි සංකීර්ණය ආරක්ෂක අමාත්‍යාංශය විසින් පවරා ගෙන ඒ වෙනුවට බලංගොඩ නන්පෙරියල් වතු යායට අයත් අක්කර 50 ක ඉඩම් කොටස විශ්ව විද්‍යාලය වෙත පවරා ගෙන තිබුණ ද එම ඉඩම් කොටසේ තක්සේරු වටිනාකම සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ඇතුලත් වී නොතිබුණි.

(ආ) 2009 වර්ෂය තුලදී මිලදී ගෙන තිබූ එකතුව රු.757,772 ක් වූ ස්ථාවර වත්කම් එම වර්ෂය තුලදීම ප්‍රාග්ධනිත කලයුතු වුවද එම ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර තිබුණේ 2010 වර්ෂය තුලදීය.

(ඇ) විශ්ව විද්‍යාලයේ ක්ෂය ප්‍රතිපත්තිය වන්නේ මිලදී ගත් වර්ෂය තුලදීම සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදනය කිරීම වුවද ඉහත (ආ) හි පරිදි 2009 වර්ෂය තුලදී මිලදී ගත් ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත නොකිරීම මත එම වර්ෂයට අදාලව සිදු කළ යුතු ක්ෂය ප්‍රතිපාදනයේ ප්‍රමාණය රු.151,554 කින් අඩුවෙන් පෙන්වා ඇති බැවින් 2010 වර්ෂයේ ආරම්භක සමුච්චිත ක්ෂය ප්‍රතිපාදනය ද එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) රු.1,455,713 ක් වටිනා උපාධි ලෝගු දේපල පිරියත හා උපකරණ යටතේ හා ජංගම වත්කම්වල අවසන් තොග යටතේ ද දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) අවුරා තබන ලද අරමුදල් ශේෂයෙහි ඇතුලත් NCAS Research Grant අරමුදලෙහි අඩංගු රු.250,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී නැවත ගැලපුම් කර තිබුණි.

( ඊ) අවුරා තබන ලද අරමුදලේ ශේෂයෙහි වැඩිවීම රු.3,852,942 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී එය රු.3,919,815 ක් ලෙස ගෙන තිබුණි.

1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්ව විද්‍යාල සේවකයින් වෙත ලබා දී තිබුණු එකතුව රු. 1,126,770 ක් වූ ණය මුදල් ඔවුන් සේවයෙන් ඉල්ලා අස්වීම,මියයෑම සහ සේවයෙන් පහ කිරීම ආදි හේතූන් නිසා 2010 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සංග්‍රහ කටයුතු වෙනුවෙන් දරන ලද රු.131,167ක් විවිධ ලැබිය යුතු ගිණුම යටතේ ගිණුම්ගත කර තිබුණ ද එම මුදල් 2011 මැයි 02 වන විටත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර නොමැති බව අනාවරණය විය.

1.2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව 2010 වර්ෂය සඳහා තවදුරටත් බුත්තල රඳවා ඇති ස්ථාවර වත්කම් වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 41/90 අනුව සෑම මාස 6 කට වරක් එක් එක් වාහනයේ දැවෙන ඉන්ධන ප්‍රමාණය කොපමණදැයි පරීක්ෂා කර ඒ අනුව කටයුතු කළ යුතු වුවත් විශ්ව විද්‍යාලය සතු වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

1.2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඇප බැඳුම්කරයක් මත රු.3,778,223 ක් ගෙවීම පැහැර හැරීම හේතුවෙන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සේවය හැර ගිය අයෙකු සේ සලකන ලද කථිකාචාර්යවරයකු නිසි සොයා බැලීමකින් තොරව හා විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 18:12:1 වගන්තියට පටහැනිව හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිසි අනුමැතියකින් තොරව සබරගමුව විශ්ව විද්‍යාලයට 2007 ජනවාරි 04 දින සිට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙස බඳවා ගෙන තිබුණි.2009 මැයි 30 දින පවත්වන ලද 142 වෙනි පාලක සභා රැස්වීමේ දී ඒ සඳහා විශ්ව විද්‍යාල

ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියක් ලබා ගැනීමට තීරණය කර ඇතත්,2011 මැයි 02 වෙනි දින දක්වාම එම අනුමැතිය ලබා ගෙන නොතිබුණි.2010 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු.2,768,635 ක් ඔහුට ගෙවා තිබුණි.ඔහු තව දුරටත් සේවයේ යෙදී සිටී.

(ආ) සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ මාණ්ඩලික නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩමුළුවේ අයවැය ලේඛනයට අනුව සහභාගිවන්නන් 60 දෙනෙකුගෙන් ආදායම රු. 900,000ක් ද වැය රු. 675,500 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණ ද සහභාගිත්වය 10ක් වූ අතර ඔවුන්ගෙන් රු.89,500 ක් පමණක් ලැබී තිබුණි.1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 99 (1) (ඈ) වගන්තිය අනුව කවර ප්‍රභවයකින් හෝ අත්කරගනු ලැබුවා වූ වෙනත් සියළු මුදල් විශ්ව විද්‍යාල අරමුදලට ඇතුලත් වේ.එසේ වුවද එයට පටහැනිව ඉහත ව්‍යාපෘතිය සඳහා එකතු කළ රු.61,000 ක මුදල ව්‍යාපෘතිය භාර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයා විසින් වැය කර තිබුණි.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රතිඵලය රු. 60,787,955 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය වූ රු.78,382,603 ක් හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලවල රු.17,594,648 ක වර්ධනයක් දක්නට ලැබුණි.එසේ වුවද රජයේ දායකත්වය ඉවත්කල විට 2009 වර්ෂයේ ඌනතාවය රු.454,179,053 ක් වූ අතර 2010 වර්ෂයේ ඌණතාවය රු.480,706,405 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.26,527,352 ක පිරිහීමක් දක්නට ලැබුණි.පුද්ගල පාරිශ්‍රමික 7.31% කින් ද,නඩත්තු වියදම් 25.55% කින්ද,ගිවිසුම් ගත සේවා 16.80% කින්ද,බාහිර වැඩමුළු වියදම් 54.46% කින් වැඩි වී තිබීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්ය සාධනය

(අ) සමාලෝචිත වර්ෂය තුල ශිෂ්‍යයින් 2786 කගේ අධ්‍යයන කටයුතු සඳහා දරන ලද පිරිවැය රු. 412,744,390 ක් වූ අතර ඒ අනුව ඒක ශිෂ්‍ය පිරිවැය රු.148,149 ක් විය.ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 2378 කගේ අධ්‍යයන පිරිවැය රු. 393,930,505 ක් වූ අතර,ඒ අනුව ඒක ශිෂ්‍ය පිරිවැය රු.166,656 ක් විය.ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.17,507කින් අඩු වී තිබුණි.

(ආ) 2009/2010 අධ්‍යයන වර්ෂයේදී වෛද්‍ය විද්‍යා පීඨයක් ආරම්භ කිරීමට 2006 -2010 සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර තිබුණද 2010 වර්ෂය අවසානය වන විට ඒ සඳහා ඉඩම වෙන්කරවා ගැනීමට පමණක් කටයුතු කර තිබුණි.

### 2.2.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිවිසුම්ගත වටිනාකම රු.9,812,890 ක් වූ කෘෂිවිද්‍යා පීඨ ගොඩනැගිල්ල III අදියර ඉදිකිරීමේ කර්මාන්තයට අදාලව එහි කොන්ත්‍රාත්කරු හට රු.2,256,981 ක ප්‍රාරම්භක අත්තිකාරමක් ගෙවා තිබුණි.කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීමේ වැඩ අතහැර දැමීම නිසා 2009 ජනවාරි 19 වෙනි දින සිට කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණ ද, නොපියවූ රු.1,179,637 ක ප්‍රාරම්භක අත්තිකාරම් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කරමින් පවතී.

(ආ) කළමනාකරණ පීඨය අදියර ii , සමාජ විද්‍යා පීඨය අදියර i සහ කෘෂි විද්‍යා පීඨය යන පීඨ ගොඩනැගිලි ඉදිකිරීම් වලට අදාලව ඉදිකිරීම් කටයුතු නිමකර එකී ගොඩනැගිලි විශ්ව විද්‍යාලය විසින් පාවිච්චියට ගෙන ඇතත් අවසන් බිල්පත් නොපියවීම නිසා එම ගොඩනැගිලි ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර තව දුරටත් කෙරීගෙන යන වැඩ ගිණුමේ රු 316,995,732 ලෙස ගිණුම් ගත කර තිබුණු අතර එම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබා දුන් රු.2,386,971 ක ප්‍රාරම්භක අත්තිකාරම් පියවීමට සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතු කර නොතිබුණි.

### 2.2.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ලක් ශිෂ්‍ය නේවාසිකාගාර දෙකක් සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පිළිවෙලින් 2005 , 2006 සහ 2007 වර්ෂ වලදී කැබිනට් මණ්ඩල අනුමැතිය දී තිබුණ ද, ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොලැබීම සහ ටෙන්ඩර් ප්‍රදානය කිරීමේ ගැටළු නිසා හා අත්‍යවශ්‍ය ඉදිකිරීම් සඳහා ප්‍රමුඛත්වය දීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම ඉදිකිරීම් ආරම්භ කර හෝ නොතිබුණි.

### 2.2.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නඩත්තු අංශ උපගබඩාවේ තෝරා ගත් භාණ්ඩ වර්ග 08 ක් සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂාවේ දී බින්කාඩ් ශේෂය හා භෞතික ශේෂය සමාන නොවූ අතර බින්කාඩ් දෛනිකව නඩත්තු නොකරන බව සහ අනුමැතියකින් තොරව භාණ්ඩ නිකුත් කරන අවස්ථා අනාවරණය විය.එසේම නිකුත් කිරීම් පත්‍රිකා වල එකී භාණ්ඩ නිකුත් කල බව සඳහන්ව තිබුණද බින්කාඩ්වල ඇතුලත් නොකල අවස්ථා 38 ක්ද බින්කාඩ් වල නිකුත්කල බව සඳහන් කර තිබුණද, නිකුත් කිරීම් පත්‍රිකා නොමැති අවස්ථා 52 ක් ද නියැදි පරීක්ෂාවේ දී අනාවරණය විය.

(ආ) ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුවට බැඩ්මින්ටන් සහ ටෙනිස් රැකට් ගට් කිරීමට ගට් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2009 ජූලි 29 දින මිල ගණන් කැඳවා තිබුණු අතර 2009 දෙසැම්බර් 10 දින රැස්වූ තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය මත සහ 2009 දෙසැම්බර් 15 දිනැති සුළු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත අතින් ක්‍රියා කරන ගට් යන්ත්‍රයක් රු.386,400 ක් ගෙවා මිලදී ගෙන තිබුණ ද මිලදී ගන්නා යන්ත්‍රයේ පිරිවිතර සඳහන් කිරීමේදී අතින් ක්‍රියාකරන හෝ විදුලියෙන් ක්‍රියාකරන යන්ත්‍රයක් ද යන්න සඳහනක් නොමැති අතර අවශ්‍ය නූල් මිලදී නොගැනීම නිසා අවස්ථා 02 කදී රු. 3,000 ක් වැය කර රැකට් 04 ක් බාහිර ආයතනයකින් ගට් කර තිබුණි.තව ද මිලදී ගත් ගට් යන්ත්‍රය නිෂ්පාදිත රට තායිවානය ලෙස ඉන්වොයිසියේ සඳහන් කර තිබුණ ද ගට් යන්ත්‍රයේ කිසිදු ස්ථානයක නිෂ්පාදිත රට සඳහන් කර නොතිබුණි.

(ඇ) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල පෞද්ගලික රථවාහන නවතා තැබීම සඳහා රථවාහන නැවතුම්පල දෙකක් සකස් කිරීමට සමාලෝචිත වර්ෂය තුල රු.484,174ක් ගෙවා අවශ්‍ය භාණ්ඩ මිලදී ගෙන තිබුණ ද 2011 මාර්තු 24 දින වන විට නිශ්චිත සැලසුමක් අනුමත නොකර එක් රථවාහන නැවතුම්පලක් පමණක් ඉදිකර තිබුණි. එහි රථවාහන නවතා නොතබන බව අනාවරණය වූ අතර ඒ සඳහා මිලදී ගත් රු.10,560ක් වූ අමානෝ මීටි ද ඉදිකරන ලද රථවාහන නැවතුම්පල සඳහා භාවිතා කර නොතිබුණි.

(ඈ) IRQUE ව්‍යාපෘතිය යටතේ රු.3,996,250 ක් වැය කර පිහිටුවන ලද සබරගමුව විශ්ව විද්‍යාලීය මුද්‍රණාලයේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීමේදී, සේවකයින් පුහුණු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද රු.568,500 ක් වූ ඇස්තමේන්තුගත මුදලින් රු.284,250 ක් අදාල ආයතනයට ගෙවා තිබුණි.එහිදී පුහුණු කාල සීමාව දින 15 ක් වුවත් කොපමණ දින ගණනක් පුහුණු කිරීම් කටයුතු සිදු කලේ ද යන්න අනාවරණය නොවූ අතර 2010 දෙසැම්බර් 10 දින ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය ලබා දුන් ඇනවුම සම්පූර්ණ කිරීමට 2011 අප්‍රේල් 08 දින වන විටත් කටයුතු කර නොතිබුණි.එසේම මෙම මුද්‍රණාලය ස්ථාපිත කිරීමෙන් පසුව ද අවස්ථා 03ක දී විශ්ව විද්‍යාලයේ මුද්‍රණ කටයුතු බාහිර ආයතනවලින් ඉටු කර ගැනීම සඳහා රු.219,426 ක් ගෙවා තිබුණි.එසේම මුද්‍රණාලයට අවශ්‍ය පොත් බැඳුම් කට්ටලය 2011 අප්‍රේල් 08 දින වන විටත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2011 පෙබරවාරි 11 වන විට මුද්‍රණ යන්ත්‍රයේ සිදු වී ඇති දෝෂයක් 2011 අප්‍රේල් 08 දින දක්වාම යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය තුල වැඩ පරිපාලකවරුන් 4 දෙනෙකු ස්ථිර සේවයේ යොදවා සිටින නමුත්, ශ්‍රවණාගාර චිත්‍රපට ප්‍රදර්ශන කටයුතු, නිල නිවාසවල දොර ජනෙල් අළුත්වැඩියා කිරීම, විභාග ශාලා සකස් කිරීම හා වීදි පහන් සකස් කිරීම ආදී වැඩ අධීක්ෂණය සඳහා ගබඩා භාරකරුවෙකු යොදවා තිබුණු අතර ඒ සඳහා ඔහුට අතිකාල දීමනා වශයෙන් රු.29,061 ක් මාස 03 ක කාලයකදී ගෙවා තිබුණි.

2.2.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

කුලියට ගත් නේවාසිකාගාර 03 ක් සඳහා අහල් 01 ජල මෝටර් 03 ක් 2005 මාර්තු 31 දින ඉල්ලුම් කර රු.51,000 ක් ගෙවා මිලදී ගෙන තිබුණු නමුත් එම අවශ්‍යතාවය සඳහා නොයොදවා ජල මෝටර් 02 ක් 2011 ජනවාරි 25 දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නේවාසිකාගාර උපපාලිකා නිල නිවාසයෙහි තබා තිබුණ අතර ඉතිරි මෝටරය කුමන අංශයක් වෙත නිකුත් කළේද යන්න විගණනයේ දී අනාවරණය නොවීය.

2.2.6 හඳුනාගත් පාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට ගබඩා තොග සමීක්ෂණය අනුව අනාවරණය වී තිබූ රු.15,594 ක් වූ තොග ඌනතා සහ රු.29,715 තොග අතිරික්තතා සම්බන්ධයෙන් විගණිත දිනය වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සේවකයින් තිදෙනෙකු වෙනුවෙන් ඔවුන්ගේ වැටුපෙන් අයකර සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු 8% දායක මුදල් රු.18,405 ක් සහ 2005 සැප්තැම්බර් මස සිට 2006 දෙසැම්බර් මාසය දක්වා වූ කාලය සඳහා සේවකයින් 11 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් අධිභාර රු.106,474 ක් ද එකතුව රු.124,879 ක් ගෙවීමට විශ්ව විද්‍යාල අරමුදලට සිදු වී තිබුණි.

2.2.7 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සිංහරාජ නේවාසිකාගාරයේ අක්‍රිය වී තිබුණු විදුලි මෝටර් 02 ක් අළුත්වැඩියා කිරීම සඳහා රු.38,500 ක් ගෙවා තිබුණද වතුර මෝටර් 02 රැගෙන ගිය සහ රැගෙන ආ බවට නේවාසිකාගාර උපපාලක නොදන්නා අතර දොරටු අවසර පත්‍ර , අදාල ධාවන සටහන සහ මේ සමග වූ වැඩ පත්‍රිකා විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) සමාජ විද්‍යා සහ භාෂා අධ්‍යයන අංශයේ ජර්මන් භාෂාව පිළිබඳ කථිකාචාර්ය ආධුනික තනතුරට බඳවා ගැනීමේ දී අවශ්‍ය අවම සුදුසුකම් හෝ සපුරා නොමැති අයකු බඳවා ගෙන, 2005 ජූලි 01 දින සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස රු.2,729,695 ක් ගෙවා තිබුණි.කෙසේ වෙතත් උක්ත තනතුර සඳහා ඔහු සුදුසුකම් ලබා ඇති බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ප්‍රකාශ කර ඇති බව උපකුලපති දැනුම් දී ඇත.

(ඇ) විශ්ව විද්‍යාලීය ලිපිකාර හා කාර්මික සේවා සංගමයේ 52 වන මහා සභා රැස්වීම-2010 සඳහා සහභාගිවීමට යාම සඳහා කුලී පදනම මත පෞද්ගලික අංශයේ බස්රථ 03 ක් ලබා ගැනීමේදී, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 789 හා 2001 සැප්තැම්බර් 24 දිනැති චක්‍රලේඛයේ සඳහන් උපදෙස්වලට පටහැනිව කටයුතු කරමින් රු.181,275 ක් ගෙවා සේවය ලබා ගෙන තිබුණි.

2.2.8. අවිනිශ්චිත ගණුදෙණු

2008 වර්ෂය තුලදී විගණනය විසින් පෙන්වා දී තිබූ හූ විඥාපන පීඨයේ අන්තර්ජාල රැහැන් පද්ධතියට සිදු වී තිබූ අලාභ හානිය රු.347,300 ක් සඳහා වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණු අතර 2010 වර්ෂයට අදාල අවසන් ගිණුම්වල එම මුදල ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු මුදලක් සේ ගිණුම් ගත කර තිබුණි.

2.2.9 අයවැය ලේඛනමය පාලනය

ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දී 11% සිට 286% දක්වා වූ විචලනයන් නිරික්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයන් ලෙස උපයෝගි කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා වරින්වර විශ්ව විද්‍යාලයෙහි උපකුලපතිවරයාගේ අවධානයට යොමු කෙරිණි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය පාලනය
(ආ) ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වා ගෙන යාම
(ඇ) වත්කම් උපයෝජනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) ගබඩා පාලනය
(ඊ) අතිකාල ගෙවීම්